# සහජීවනය හා සංහිඳියාව ඇති කිරීමෙහිලා ගීත කලාවේ රසාස්වාදනීය දායකත්වය

*අසිත මල්ලව ආරච්චි*

ධනේශ්වර ලෝකයේ පැවැත්ම සඳහා යුද්ධය අත්‍යවශ්‍ය සාධකයක් වේ. දැනුමෙන් ද විද්‍යාවෙන් ද පොහොසත් අනාගත භාවිතය තුළ යුද්ධයට හිමිවන්නේ සුවිශේෂී අවස්ථාවකි. සංවිධානාත්මකව සිදුකෙරෙන විවිධ සංග්‍රාමයන් වල දී චින්තනය, බුද්ධිය මෙන්ම ආයුධමය මෙවලම් ද භාවිත කරනු ලැබේ. විශ්වයෙහි පවතින සියලු ජීවී අජීවී සෑම සම්පතක්ම අත්පත්කර ගැනීම යුද්ධයේ පූර්ව අවශ්‍යතාව වේ. යුද්ධයක් ආරම්භ කිරීම ඉතාමත් පහසු ය. එමෙන්ම එය සරල කාරාණාවක් ලෙස  විග්‍රහ කළ හැකිය. නමුත් එහි ප්‍රතිඵල අතිශය ඛේදනීය සහ කාලාන්තරයක් යන තුරු ඉන්මිදීමට නොහැකි ය.

යුද්ධය විසින් ඉරාකය, සිරියාව, ඇෆ්ගනිස්ථානය, ජපානය වැනි රටවල්වල පාසල් දහස් ගණනක් ගිණිබත් කළ අතර දරුවන්ට අධ්‍යාපනය ලැබීමට පැවති පහසුකම් අතිශයින් සීමාවකට පත්කරන ලදී . මහාචාර්ය ඩැජෙස්ටර් පවසන්නේ,"තමන්ගේ අභ්‍යාස පොත්වල තිබෙන ප්‍රශ්නවලට පිළිතුරු සොයන ශිෂ්‍යයන් අතිශය වාසනාවන්ත වේ. මන්ද ඔවුන් මේසයක් අසල පුටුවක හිඳ කලුලෑල්ලක් ඉදිරිපිට සිටින ගුරුවරයෙකු සහිත පන්තිකාමරයක සිට අධ්‍යාපනය ලබන නිසාවෙනි. නමුත් ඇෆ්ගන් දරුවන් සියදහස් ගණනක් අභ්‍යාසපොත්වල ප්‍රශ්නවලට පිළිතුරු සොයනවා වෙනුවට හිඳගැනීමට පුටුවක්, ලිවීමට මේසයක්, පන්තිකාමරයට ගොඩනැගිල්ලක් ගැන සිහින දකිමින් සිටිති".

යුද්ධයෙන් විනාශයට පත්වූ ගම් බිම්, ගොඩනැගිලි, මංමාවත් නැවත ප්‍රතිසංස්කරණය කිරීමට හැකියාව පවතී. නමුත් යුද්ධයෙන් පැරුණු හදවත් සුවපත් කිරීම ඉතා අපහසු කාරණාවකි. එම බිඳුණු හිත් නැවත පුනරුත්ථාපනය කිරීමේ මහා සංස්කෘතික, අධ්‍යාත්මික අරගලයට පෙරමුණ ගන්නේ කලාකරුවන් ය. 1917 ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවයෙන් පසු නව රුසියානු සාහිත්‍ය ගොඩනැගන්නේ එම ප්‍රස්තුතය පදනම් කර ගෙන විය හැකි ය. විප්ලවයට පදනම සකසන එම සාහිත්‍ය ම නැවත සංහිඳියාව ඇතිකිරීමට උත්සහදැරීම කෙතරම් අපූර්ව ද?

ජනවාර්ගික අර්බුදය දශක තුනක්පුරා ලක්ෂ සංඛ්‍යාත අහිංසක ජීවිත මරණයට පත්කරමින් ලංකාව පීඩාවටපත් කළේය. තිස් වසරක් සටන්කොට යුද්ධය නිමාකරන ලද්දේ,බොහෝ අහිංසකයන් මරණයට පත්කරමින් හා ධන ධාන්‍ය විනාශයට පත්කරමින්, නිවාස විනාශයට පත්කරමින්, පවුල් නැති කරමින් හා මිනිසුන් සිසිකඩ අසරණභාවයට පත්කරමින් ය. එසේ යුද්ධය නිසා උන්හිටි තැන් අහිමි වී දෙමාපියන් පවා අහිමිව සරණාගත කඳවුරක ගාල් වූ ළදැරියක තේමාකොට ගත් සරෝජා ගීත යසංහිඳියාවෙන් පෝෂණය කිරීමට කරන ලද ප්‍රයත්නයක් ලෙෂ අපට විමර්ශනය කළ හැක.

මහින්ද චන්ද්‍රසේකර යනු තවත් ගීත රචකයෙකුවත්, හොඳ ගීත රචකයෙකුවත් නොව.ඔහු ස්වකීය අනන්‍යතා ලක්ෂණ පෙන්නුම් කරන කවියෙකි. ඒ නිසා ම මන්නාරම් ප්‍රදේශයේ සිට මඩුපල්ලියෙන් හමා එන සුළඟෙහි ගිනියම් උණුසුම සිය කවියට කැටිකර ගනී. ගින්න පමණක් නොව වෙඩිහඬ ද නුදුරින් ඇසේ. පුංචිබංකුවක් මත හිඳගෙන අකුරු කරන දැරියගේ අකුරු ඇදවන්නේ වෙඩිහඬෙහි බිකරු බව නිසාවෙනි. එම දැරිය සරෝජා වන අතර ගුරුතුමිය හා එකම පංතියේ සිටී.

මාතොටින් එන උතුරු සුළඟේ
ගිනි සිඹින මඩුපල්ලියේ

දැස් අගමුතු කඳුලු හංගන සරෝජා මගේ දෝණියේ
වෙඩි හඬට පොඩි අකුරු ඇඳෙවෙයි
මක්කරන්න ද පැංචියේ
ගුරුතුමී මා සිසුවියයි ඔබ
ඒත් අපි එක පංතියේ

මෙම ගීතය ප්‍රබල නිර්මාණයක් වන්නේ, රූපකාර්ථ නංවන භාෂා අනුභූතිය හේතුවෙනි.සිසුවියත් ගුරුතුමියත් මායිම්බෙදා ගන්නට තැත් කරන යුදපසුබිමක එක ම පන්තියක සිටවයි. යුද්ධයේ භයංකර බවත් ගුරුතුමියගේ මෘදු මොළොක් බවත් එක්ව තබන්නේ රචකයාගේ අපූර්ව නිර්මාණාත්මක ශක්‍යතාව පිළිබිඹුකරමින් ය. යුද්ධයෙන් පීඩාවිඳින අහිංසක සිංහල මිනිසුන් මෙන්ම දෙමළ මිනිසුන් පිළිබඳව ද අපට නොයෙක් විට අසන්නට ලැබේ. එවැනි සැබෑ සිද්ධියකින්වත් සසල නොවන, කම්පනය නොවන, ගැඹුරට කතා කළ හැකි වස්තුබීජයක් මෙම ගීතයට පාදක වී ඇත.

කෙතරම් හුරු පුරුදුවුවත් වෙඩි හඬට බියවන සරෝජා, ඇය ජීවත්වන බියකරු පරිසරය ඇය අත්හැර යන අයත් සමඟ දුක් විඳින එම පංතියේ ම ගුරුවරිය, යුද්ධයෙන් මියගිය නොඑසේ නම් මායිමෙන් ඈතට පළා ගිය සරෝජාගේ වයසේ පුංචි දරුදැරියන්, මියගිය හමුදාසෙබලුන්, ත්‍රස්තවාදීන් මෙන් ම අනාගතයේ බේබිලාට මෙහෙවර කිරීමට සිදුවන සරෝජාගේ අනාගතය, මේ සියල්ලම චිත්තරූප මවන අපූරුව එම ගීතයෙන් මොනවට පැහැදිලි කරයි.

කර වටේ අත දමා හිනැවුණු
කෝ නුඹේ පොඩි යාළුවන්
දයාවක් නැති ලෝකයක් දැක
උන් ගිහින් පැන මායිමෙන්

යුද්ධය නිසා මානව සබඳතා බිඳී විසිරී, මිනිස් ජීවිත අවතැන් වන ආකාරය ශෝචනීය ආකාරයෙන් රචකයා විස්තරකරයි. ඇති හැකි සියල්ලෝ යුද්ධයේ මායිමෙන් පළා ගොසිනි. අසරණයෝ කඳවුරුවල ගාල්වෙති. මානවලෝකය ගිලන් වී ඇතිබවත්, තමන් රැකො වනවා විනා අනුන්හට රැකවරණය සැලසිය නොහැකිබවත් , රචකයා නිර්මාණාත්මකව ප්‍රකාශ කරන්නේ ඉතා අපූර්වත්වයෙන් ය.

මන්දිරේ දොර නුඹව කැඳවයි
බේබිලා හඬනා හඬින්
මායිමේ වැට අත වනයි හෙට
අවිදරා රකිනා ලෙසින්
දමා ගොදුරක කෙලෙස යන්න ද
ඒත් යන්නට වේ ඉතින්
වරක් දැක සිත නිවා ගන්නට
දුවේ ඩිංගක් හිනැහියන්

මානව ප්‍රේමය බිඳ වැටී ලෝකය ගිලන් වී ඇති ආකාරය තුළ යුද්ධය අනුභව කරන සමාජක්‍රමය පිළිබඳ පාඩමක් අප වෙත කියාදෙයි.යුද්ධය තුළ මිනිසුන් මැරෙද්දී, අවිවිකිණෙන ආකාරය මෙන්ම දරුවන්

වහල් සේවයේ යොදවනආකාරය අපූර්ව ආකාරයටපැහැදිලිකර ඇත. ධනේශ්වරයේ ඉඳුල් මතින් ගොස් බොරදියේ මාලු බාන විෂම සමාජයේ යථාර්ථය පැහැදිලි කරමින් සරෝජාලාගේ අනාගතය අඳුරුවන ආකාරය සියුම්ව ධ්වනිත කරයි. වර්ගවාදී සමාජයක අවිහිංසාව රජ කරන විට,මානව දයාව අමතක කරන විට, සාමය විකුණන විට, සංහිඳියාව ගීතයක් පමණක් බව රචකයා අපූර්ව ආකාරයෙන් ප්‍රකාශ කරයි. නමුත් අවසානයේ ආත්මික සහනය වෙනුවෙන් වරක් දැක සිත නිවා ගන්නට ඩිංගක්වත් හිනැහෙන්ට යැයි කියන අව්‍යාජ මානව හැඟීම තුළින් අප තුළ සැඟව ඇති පුරුෂාර්ථ බව ප්‍රකට කරයි.

මෙම ගීතයේ රචකයා වන්නේ මහින්ද චන්ද්‍රසේකරයන් වන අතර සංගීත සංයෝජනය සංගීතවේදී රෝහණ වීරසිංහයන්ගෙනි. යුද බියෙන් පෙලුණු ජනතාවගේ හදවත්වලට ගීතයෙන් අමතන්නේ ගායන ශිල්පිනී දීපිකා ප්‍රියදර්ශනි ය. සාමය හා මානව හිතවාදය උදෙසා නන්අයුරින් කැප වී සිටින ක්‍රියාකාරීන් අගයමින් පිලිපීනයේ ගුසි සාම පදනම විසින් පිරිනමන"ගුසි"සාම ත්‍යාගයෙන් පිදුම් ලැබූ එකම ලාංකීය ගීතය ද වන්නේ ය.

..................................................